# නාගරික ඝන අපද්‍රව්‍ය වලින් කොම්පෝස්ට් නිපදවීම පිළිබඳ ජාතික වැඩමුළුව

**බලශක්ති සංසදය**

නගර සහා බල ප්‍රදේශ වල එකතු වන කැලි කසල වලින් කොම්පෝස්ට් නිපදවීම පිළිබඳව ලබා ඇති අත්දැකීම් හුවමාරු කරගැනීම සහ ඉදිරියේ දී දියත්වීමට නියමිත වැඩසටහන් සැලසුම් කර ගැනීම සඳහා වූ ජාතික වැඩමුළුවක් හික්කඩුව අමායා රීෆ් හෝටලයේ දී 2008 නොවැම්බර් 20-22 යන තෙදින තුළ දී පැවැත්විණි.

මෙම වැඩමුළුව බලශක්ති සංසදය සහ වේස්ට් ඉන්ටර්නැෂනල් යන ආයතන විඑන්ජී ඉන්ටර්නැෂනල් ආයතනයේ මූල්‍ය ආධාර ඇතිව පවත්වන ලදි. ඒ සඳහා පාරිසරික සහ ස්වාභාවික සම්පත් අමාත්‍යාංශයේ පිළිසරු ව්‍යාපෘතියේ ද සහයෝගය ලැබී තිබුණි. මෙම වැඩමුළුවේ ප්‍රධාන ආරාධිතයා ලෙස මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති උදය ගම්මන්පිල මහතා සහභාගී වූ අතර වේස්ට් ඉන්ටර්නැෂනල් ආයතනය නියෝජනය කරමින් එහි ජ්‍යෙෂ්ඨ උපදේශක වැලන්ටින් පෝස්ට් මහතා ද පිළිසරු ව්‍යාපෘතියේ සැළසුම් කලමනාකරු මාලක දසනායක මහතා ද බස්නාහිර පලාත් ඝන අපද්‍රව්‍ය කලමනාකරන අධිකාරියේ නෙරන්ජා ජයසේන මහත්මිය ද බලශක්ති සංසදයේ බන්දුල චන්ද්‍රසේකර මහතා ද සහභාගී විය. එම වැඩමුළුව මෙහෙයවනු ලැබුයේ බලශක්ති සංසදයේ අධ්‍යක්ෂක සහ පරිසර අමාත්‍යාංශයේ උපදේශක අශෝක අභයගුණවර්ධන මහතා විසිනි.

නාගරික කැලි කසල බැහැර කිරීම දැනට ශ්‍රී ලංකාවේ ඇති බරපතලම නොවිසඳුණු ප්‍රශ්නයකි. දිරායන කසල බැහැර කිරීම වඩාත්ම බරපතල ප්‍රශ්නයක්ව ඇත්තේ දුගඳ හැමීම සහ ජලමාර්ග දූෂණය වන නිසාය. මීට පිළියමක් ලෙස දිරායන කසල වලින් පහත් බිම් සනීපාරක්ෂක ලෙස ගොඩ කිරීමට යොදා ගැනීම සඳහා අත්හදා බැලීම් සිදු කර ඇත. එහෙත් පහත් බිම් ගොඩ කිරීම නිසා ජලය රඳවන භූමි අහිමිවී යන නිසාත් කසල වල අඩංගු අගනා කාබනික ද්‍රව්‍ය අපතේ යන නිසාත් මෙය දිගුකාලීන වශයෙන් සුදුසු විකල්පයක් නොවේ. දිරායන නාගරික කසල වලින් පොහොර නිපදවීම සඳහා දැනට අත්හදා බලා ඇති ප්‍රධාන ක්‍රම දෙකක් වන්නේ කොම්පෝස්ට් අංගන කිරීම සහ ජීවවායු ජනක ස්ථාපිත කිරීමයි. මෙම විකල්ප අතරින් දැනට වඩා පහසු සහ දිගටම ක්‍රියාත්මක කළ හැකි විසඳුම වී ඇත්තේ කසල වලින් කොම්පෝස්ට් නිපදවීමයි.

මෙම වැඩමුළුව අදියර දෙකකින් ක්‍රියාත්මක වූ අතර එහි පලමු අදියර දැනට කසල වලින් කොම්පෝස්ට් පොහොර නිපදවන ආයතන වල සහභාගිත්වයෙන් පැවැත්විනි. එයට දැනට කොම්පොස්ට් නිපදවන පලාත් පාලන ආයතන, රාජ්‍ය නොවන සංවිධාන සහ පුද්ගලික අංශයේ සමාගම් වල නියෝජිතයෝ සහභාගී වූහ. එහිදී කොම්පෝස්ට් නිපදවීමට අදාලව දැනට ලබා ඇති සාර්ථකත්වයන්, මුහුණු දීමට සිදුවී ඇති අභියෝග සහ ඒවා ජය ගැනීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව අවධානය යොමුවිය. වැඩමුළුවේ දෙවන අදියර පිළිසරු ව්‍යාපෘතිය යටතේ අළුතින් කොම්පෝස්ට් වැඩසටහන් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන පලාත් පාලන ආයතන වල නිලධාරීගේ කුසලතා වර්ධනය කිරීම සඳහා වෙන්විය. මෙම වැඩමුළුව සඳහා ආයතන 30 කින් නිලධාරීන් 60ක පමණ පිරිසක් සහභාගී විය.

වැඩමුළුවේ දී වැඩි අවධානයක් යොමුවූයේ කොම්පෝස්ට් නිපදවීමට අදාල තාක්ෂණික ගැටළු, කලමනාකරන ගැටළු සහ කොම්පෝස්ට් අලෙවිය පිළිබඳ ගැටළු වෙතය.

1. දැනට ලංකාවේ නාගරික කැලි කසල වලින් කොම්පෝස්ට් නිපදවීමට අදාල තාක්ෂණික ක්‍රම ගණනාවක් ශ්‍රී ලංකාවේ අත්හදා බලා ඇති නමුත් මේ වන තෙක් දුෂ්කරතා මැද වුවද අඛණ්ඩව පවත්වාගෙන යන ක්‍රමය බවට පත්වී ඇත්තේ වාතනය සහිත ගොඩ කොම්පෝස්ට් ක්‍රමයයි. මේ සඳහා ක්ෂුද්‍රජීවීන් පිළිබඳ විද්‍යාත්මක දැනුම කොම්පෝස්ට් නිෂ්පාදනාගාර සඳහා අවශ්‍ය වන බැවින් එම විශේෂඥ සේවාවන් විධිමත් ලෙස ලබාදීම පිළිබඳ විධිමත් වැඩපිළිවෙලක් සම්පාදනය කරගත යුතු වේ.

2. එමෙන්ම මෙම කොම්පෝස්ට් නිෂ්පාදනාගාර ස්ථාපිත කිරීමට අදාලව විධිමත් සැලසුම් අවශ්‍ය වන නමුත් පලාත් පාලන ආයතන වල නිලධාරීන් මෙම සැලසුම් සකස් කිරීම පිළිබඳව විධිමත් පුහුණුවක් ලබා නැත. තවද කොම්පෝස්ට් සකස් කිරීමේ දී මතුවන ගැටළු සහ ඒවා විසඳගන්නා ආකාරය පිළිබඳ දැනුමක් එම ක්‍රියාවලියේ නිරත සේවකයන් හට තිබිය යුතු වන නමුත් පලාත් පාලන ආයතන ආශ්‍රිත සේවකයන් හට එවන් පුහුණුවක් ලැබී නැත. එබැවින් කොම්පෝස්ට් නිශ්පාදනාගාර ස්ථාපිත කිරීමටත් එම නිෂ්පාදනාගාර නිසි පරිදි පවත්වාගෙන

යාමටත් අදාලව විශේෂඥ සේවාවන් ලබාගෙන විධිමත් පුහුණු වැඩසටහනක් දියත් කිරීම අවශ්‍ය වේ.

3. නිෂ්පාදනය කරනු ලබන කොම්පොස්ට් වල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සහ සහතික කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් දැනට නැත. එබැවින් නාගරික කසල ඇසුරින් නිපදවන කොම්පොස්ට් වල ප්‍රමිතිය පිළිබඳ යම් අවිනිශ්චිතතාවයක් මතුවී ඇත. දියුණු රටවල නාගරික කසල වල මෙන් ශ්‍රී ලංකාවේ නාගරික කසල වල බැර ලෝහ අඩංගුවී නැති බව කරනු ලැබූ පරීක්ෂා මඟින් තහවුරු වී ඇති නමුත් ඒ පිළිබඳ සහතික කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් නොමැති බැවින් මෙම අවිනිශ්චිත තත්වය පැන නැඟී ඇත. තවද කරනු ලබන පරීක්ෂාවන් සඳහා අධික මිළක් රසායනාගාර වලින් අය කරන බැවින් වාරිකව විධිමත් ලෙස කොම්පෝස්ට් නියැදි පරීක්ෂා කරගැනිමට කොම්පෝස්ට් නිපදවන්නන්හට නොහැකි වී ඇත. මෙම තත්වය වෙනස් කිරීම සඳහා කඩිනම් පියවරක් ගත යුතු බවට වැඩමුළුවේ දි යෝජනා වූ අතර ඒ සඳහා සුදුසු රසායනාගාර පහසුකම් 2009 අප්‍රේල් මස 1 වන දිනට ප්‍රථම ඇති කිරීමට පියවර ගන්නා බව මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති උදය ගම්මන්පිල මහතා වැඩමුළුවේ දි ප්‍රකාශ කලේය.

4. නාගරික කසල කලමනාකරනය ලෝකයේ වේගයෙන් දියුණු වන විද්‍යාවක් සහ කර්මාන්තයක් වුවද තවමත් ශ්‍රී ලංකාවේ කසල කලමනාකරනය සම්බන්ධයෙන් පවතින්නේ ඉතා නොදියුණු තත්වයකි. ශ්‍රී ලංකාවේ දී එම කර්මාන්තයේ යෙදී සිටින්නේ සමාජයේ අඩු වරප්‍රසාදලාභී ජන කොට්ඨාශයකි. පලාත් පාලන ආයතන ආශ්‍රිතව සේවය කරන අනියම් කම්කරුවන්ගේ සහ සෙසු සේවකයන්ගේ කුසලතාව සහ කාර්යක්ෂමතාව පහල මට්ටමක පවතින බැවින් ස්ථාවර ලෙස කොම්පෝස්ට් කර්මාන්තය පවත්වාගෙන යාමට නම් නව පිරිස් කලමනාකරන වැඩ පිළිවෙලක් දියත් කළ යුතුය. මේ සඳහා පලාත් පාලන ආයතන වලට පුද්ගලික අංශයේ කලමනාකරන විධික්‍රම යොදාගැනිම සඳහා සුදුසු ක්‍රමවේදයක් අවශ්‍ය වේ. ඒ සම්බන්ධ අත්හදාබැලීම් දැනට සාර්ථකව කොම්පෝස්ට් වැඩසටහන් දියත් කරන බලංගොඩ සහ හම්බන්තොට නගර සභා ප්‍රදේශ වල සිදු කර ඇත. එහිදී පුද්ගලික අංශයේ කලමනාකරන ක්‍රමවේදය කසල කලමනාකරනය සඳහා භාවිතා කර ඇත. කසල කලමනාකරනය සම්පූර්ණයෙන්ම පුද්ගලික අංශයට පැවරීම පිළිබඳ පලාත් පාලන ආයතන වලට දැනට ඇත්තේ අයහපත් අත් දැකීමකි. ඒ අනුව පසුගිය සමයේ දී පුද්ගලික සමාගම් පලාත් පාලන ආයතන රැවටීමකට ලක් කර ඇත. මේ නිසා පලාත් පාලන ආයතන සහ පුද්ගලික අංශය අතර හවුල් කාරිත්වයක් ඇති කිරීම අවශ්‍ය වී ඇත. මේ පිළිබඳව හම්බන්තොට සහ බලංගොඩ ප්‍රදේශ වල ලබා ඇති අත්දැකීම් වෙනත් ප්‍රදේශ වලට ද භාවිතා කල හැක.

5. වාතනය සහිත ගොඩ කොම්පෝස්ට් ක්‍රමය සාර්ථක කරගැනිම සඳහා කසල වෙන්කර ගැනිම අවශ්‍ය වන අතර ඒ සඳහා විශාල මිනිස් ශ්‍රමයක් අවශ්‍යවේ. එම නිසා සෙසු කොම්පෝස්ට් නිපදවීමේ වැඩසටහන් වලට වඩා නාගරික කසල වලින් කොම්පෝස්ට් නිපදවීම සඳහා වැය වන පිරිවැය විශාලය. එමෙන්ම කොම්පෝස්ට් මධ්‍යස්ථානය පවත්වාගෙනයාම සඳහා ඇති ප්‍රධානතම ආදායම් මාර්ගය වන්නේ කොම්පෝස්ට් අලෙවියයි. එහෙත් රසායනික පොහොර සඳහා ඉතා විශාල සහනාධාරයක් ලබාදෙන බැවින් සාමාන්‍ය වෙළඳ පොලේ දී කොම්පෝස්ට් අලෙවිය පිළිබඳ දැඩි දුෂ්කරතාවයක් පැනනැඟී ඇත. දැනට කොම්පෝස්ට් පොහොර නිපදවන මධ්‍යස්ථාන වල නිපදවන මුළු කොම්පෝස්ට් ප්‍රමාණයම දැනට පවතින වෙළඳපොල මිළ ගණන්වලට අලෙවි කළ ද ඉන් පියවාගත හැක්කේ මධ්‍යස්ථානයේ මුළු වියදමින් සියයට 50ක් පමණි. අනෙක් අතට නිපදවන මුළු කොම්පෝස්ට් ප්‍රමාණය ද අලෙවි කර ගතහැකි තත්වයක් දැනට නැත. එම නිසා කොම්පෝස්ට් අලෙවිය සඳහා කිසියම් ක්‍රමවේදයක් සකසා දීම රජයේ වගකීමක් වේ. ඒ සඳහා එක්කෝ රසායනික පොහොර වලට මෙන්ම කොම්පෝස්ට් පොහොර වලට ද සහනාධාර ලබා දිය යුතු වන අතර නොඑසේනම් ගොවීන් කොම්පෝස්ට් පොහොර සඳහා හුරු කරවීම උදෙසා කොම්පෝස්ට් පොහොර රජය විසින් මිළ දී ගෙන ගොවීන් අතර බෙදාදීමට කටයුතු කළ යුතුව ඇත.

මේ අනුව නාගරික කසල වලින් කොම්පොස්ට් නිපදවීමේ වැඩසටහන් සාර්ථක කරගැනිම සඳහා ඉහත සඳහන් පියවර ගත යුතු බව මෙම ජාතික වැඩමුළුව මඟින් නිර්දේශ කර ඇත. පාරිසරික සහ ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය මඟින් අරඹා ඇති පිළිසරු වැඩසටහන යටතේ පලාත් පාලන ආයතන ගණනාවකට කොම්පෝස්ට් වැඩසටහන් ඇරඹීම සඳහා මූලය පහසුකම් ලබා දී ඇත. එම වැඩසටහන් වල තිරසාර පැවැත්ම රඳාපවතින්නේ දැනට මතුවී ඇති අභියෝග ජයගැනිම සඳහා ඉහත සඳහන් ක්‍රියාමාර්ග දියත් වන්නේ නම් පමණක් වන බැවින් ඒ පිළිබඳ අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍ය වී ඇත.